## 2.9 දකුණු ආසියානු කලාපයේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම

ඔසන්ත නයනප්‍රිය තල්පාවිල [1]

ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

## ABSRACT

15 වන සාර්ක් සමුළුව ප්‍රධාන වශයෙන්ම අවධානයට යොමුකළ කලාපීය අර්බුද දෙකක් වූයේ ත්‍රස්තවාදි උවදුර සහ ආහාර අර්බුදයයි. මෙයින් වහා පිළියම් යෙදිය යුතු ගැටලුවක් ලෙස ත්‍රස්තවාදය පිළිගනු ලැබු අතර ත්‍රස්තවාදය පිටුදැකීම සඳහා කඩිනම් ප්‍රඥප්ති සකස් කිරීමේ වැදගත්කමද මෙම සමුළුවේදී අවධාරණය කෙරුණි.

දකුණු ආසියානු කලාපයේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ උත්සාහය කොතෙක් දුරට සපල කරගත හැකිද සහ ඒ සඳහා පසුබිම් වූ කලාපීය දේශපාලන තත්ත්වය කුමක්ද යන්න තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. WOT විශ්ලේෂණ ක්‍රමවේදය අධ්‍යයනය සඳහා භාවිතා වේ. අවසානයේදී ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සම්බන්ධයෙන් දකුණු ආසියානු කලාපයේ දැකගත හැකි ප්‍රධානතම ප්‍රවණතාවයන් ලෙස පහත සඳහන් කරුණු හඳුනා ගෙන ඇත.

ඒ අනුව කලාපීය රටවල් ක්‍රමයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට නැඹුරුවෙමින් පැවතීම ප්‍රධාන ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැකි අතර, අභ්‍යන්තර ත්‍රස්තවාදී ව්‍යාපාර ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ කොටස් කරුවන් වීම ප්‍රධාන තර්ජනයක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර බලවතුන් ජාත්‍යන්තර ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට අදිටන් කර තිබීමත් ඒ සඳහා ක්‍රියාත්මක වීමත් යහපත් ප්‍රවණතාවයක් ලෙස දිස්වන අතර, කලාපීය රටවල දිළිඳුභාවයට පිළියම් යෙදීමට සිදුවීම සමස්ත වශයෙන් දකුණු ආසියාව මුහුණ දෙන තර්ජනයක් ලෙස හඳුනාගත හැක.

**Key words** : ත්‍රස්තවාදය, ජාත්‍යන්තර ත්‍රස්තවාදය, දිළිඳුභාවය